# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2057/5 - 2018 පෙබරවාරි මස 05 වැනි සඳුදා - 2018.02.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 15/2014

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 58 වන වගන්තිය සමග කියවිය යුතු, එහි 26 වන වගන්තිය සහ 30 වන වගන්තිය යටතේ නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

සජිත් ප්‍රේමදාස,
නිවාස සහ ඉදිකිරීම් අමාත්‍ය.

2018 ජනවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2017 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (සුදුසුකම්ලත් තැනැත්තන් ලියාපදිංචි කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු ලෙස ලියාපදිංචි වීමට අදහස් කරන යම් තැනැත්තකු විසින්, සුදුසුකම්ලත් තැනැත්තකු ලෙස ඒ තැනැත්තා ලියාපදිංචි කිරීම සඳහා අවස්ථාවෝචිත පරිදි, සෘජුවම (මෙහි මින්මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත හෝ අදාළ වෘත්තීය මණ්ඩලය මගින් අධිකාරිය වෙත හෝ අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

3. ඉහත කී පනතේ 26 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) සහ (ඉ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති තැනැත්තන් හෝ එකී පනතේ 26 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති තැනැත්තකු නොවන වෙනත් යම් තැනැත්තකු ලියාපදිංචි කිරීම සඳහා වූ නිර්ණායක මෙහි උපලේඛනයේ I වන කොටසේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

4. සුදුසුකම්ලත් තැනැත්තකු ලෙස අධිකාරියේ ලියාපදිංචි වූ යම් තැනැත්තකු විසින්, මෙහි උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව දක්වා ඇති අදාළ ලියාපදිංචි කිරීමේ ගාස්තු ගෙවීමෙන් පසුව එම තැනැත්තාට ලියාපදිංචි කිරීමේ අංකයක් ලබා දී ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර එම සහතිකයේ එය වලංගු වන්නා වූ කාලසීමාව නිශ්චිතව දක්වා තිබිය යුතු යි.

5. යම් සුදුසුකම්ලත් තැනැත්තකුගේ අදාළ වෘත්තීය මණ්ඩලය හෝ ලියාපදිංචි කිරීමේ මණ්ඩලය මගින් නිර්මාණ හා ප්‍රලේඛන ප්‍රමිති පවත්වාගෙන නොයන්නේ නම්, එම සුදුසුකම්ලත් තැනැත්තා මෙහි උපලේඛනයේ III වන කොටසේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමිතිවලට අනුකූල විය යුතු ය.


1A - G 27058 — 57 (2018/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

6. අධිකාරියේ ලියාපදිංචි වූ සෑම සුදුසුකම්ලත් තැනැත්තකු ම, එම ලියාපදිංචියෙහි කාල සීමාව ඉකුත්වන දිනයට පෙරාතුව, එම සහතිකය අලුත් කිරීම සඳහා මෙහි උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව දක්වා ඇති අලුත් කිරීමේ ගාස්තු ද සමඟ අවස්ථාවෝචිත පරිදි, ඍජුවම අධිකාරිය වෙත හෝ අදාළ වෘත්තීය මණ්ඩලය මගින් අධිකාරිය වෙත හෝ අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

## උපලේඛනය

### *I වන කොටස*

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය සහ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකවරුන්ගේ ආයතනය සහ වාස්තු විද්‍යාඥයන් ලියාපදිංචි කිරීමේ මණ්ඩලය යන වෘත්තීය මණ්ඩලවල සාමාජිකයන් නොවන තැනැත්තන් ලියාපදිංචි කිරීම සඳහා වන නිර්ණායක.

සුදුසුකම්ලත් තැනැත්තකු ලෙස, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය සහ ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකවරුන්ගේ ආයතනය සහ වාස්තු විද්‍යාඥයන් ලියාපදිංචි කිරීමේ මණ්ඩලය යන වෘත්තීය මණ්ඩලවල සාමාජිකයකු නොවන තැනැත්තකු ලියාපදිංචි කිරීම සඳහා වූ නිර්ණායක, අදාළ වෘත්තීය හෝ ආයතනික මණ්ඩලය හෝ පාර්ලිමේන්තු පනතකින් පිහිටුවන ලද යම් ලියාපදිංචි කිරීමේ මණ්ඩලයක් විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

### *II කොටස*

### සුදුසුකම්ලත් තැනැත්තන් සඳහා ලියාපදිංචි කිරීමේ සහ අලුත් කිරීමේ ගාස්තු

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, ශ්‍රී ලංකා වාස්තු විද්‍යා ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකවරුන්ගේ ආයතනය සහ වාස්තු විද්‍යාඥයන් ලියාපදිංචි කිරීමේ මණ්ඩලය යන වෘත්තීය මණ්ඩලවල සාමාජිකයන් නොවන තැනැත්තන් සඳහා ලියාපදිංචි කිරීමේ ගාස්තු සහ අලුත් කිරීමේ ගාස්තු පහත සඳහන් කර ඇති පරිදි විය යුතු ය. අධිකාරිය විසින් ඒ ගාස්තු කලින් කලට සංශෝධනය කරනු ලැබිය හැකි ය.

***ඉංජිනේරු විද්‍යා***

| කාණ්ඩය | ලියාපදිංචි ගාස්තු | වාර්ෂිකව අලුත් කිරීමේ ගාස්තු |
|---|---|---|
| ඉංජිනේරු | රු. 100,000.00 | රු. 50,000.00 |
| සහකාර/අනුබද්ධ ඉංජිනේරු | රු. 90,000.00 | රු. 40,000.00 |

***වාස්තු විද්‍යා***

| කාණ්ඩය | ලියාපදිංචි ගාස්තු | වාර්ෂිකව අලුත් කිරීමේ ගාස්තු |
|---|---|---|
| වාස්තු විද්‍යා | රු. 100,000.00 | රු. 50,000.00 |

***ප්‍රමාණ සමීක්ෂණයේ දී***

| කාණ්ඩය | ලියාපදිංචි ගාස්තු | වාර්ෂිකව අලුත් කිරීමේ ගාස්තු |
|---|---|---|
| ප්‍රමාණ සමීක්ෂක | රු. 100,000.00 | රු. 50,000.00 |
| සහකාර ප්‍රමාණ සමීක්ෂක | රු. 90,000.00 | රු. 40,000.00 |

ඉහත ගාස්තුවල අදාළ බදු ඇතුළත් කර නැත.

### *III කොටස*

### අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද සම්මත ලේඛනවල ලැයිස්තුව

| *ප්‍රකාශන අංකය* | *ප්‍රකාශනයේ නම* |
|---|---|
| ICTAD/SBD/01 | Standard Bidding Document - Procurement of Works - [2nd Edition -(Revised) January 2007] |
| අයිසීටීඒඩී/එස්බීඩී/01 | ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛනය - වැඩ සැපයුම් - 2007 ජනවාරි 2 වන (සංශෝධිත) සංස්කරණය |

*III කොටස (සම්බන්ධිතයි)*

**අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද සම්මත ලේඛනවල ලැයිස්තුව**

| *ප්‍රකාශන අංකය* | *ප්‍රකාශනයේ නම* |
|---|---|
| ICTAD/SBD/01 (Vol-1)<br>අයිසීටීඒඩී/එස්බීඩී/01<br>(1 - වෙළුම) | Standard Bidding Document (Volume - 1)<br>ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛනය - (1 - වෙළුම) |
| ICTAD/SBD/01 (Vol-2)<br>අයිසීටීඒඩී/එස්බීඩී/01<br>(2- වෙළුම) | Standard Bidding Document - Procurement of Works - [2nd Edition -(Revised) January 2007]<br>ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛනය-වැඩ සැපයුම් - 2007 ජනවාරි 2 වන (සංශෝධිත) සංස්කරණය |
| ICTAD/SBD/01(Vol. 2)<br>අයිසීටීඒඩී/එස්බීඩී/01<br>(2 - වෙළුම) | Standard Bidding Document (Volume - 2) - CD<br>ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛනය - (2 - වෙළුම) සීඩී |
| ICTAD/SBD/02<br>අයිසීටීඒඩී/එස්බීඩී/02 | Standard Bidding Document - Major contracts (2nd Edition (Revised) January 2007)<br>ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛනය - ප්‍රධාන කොන්ත්‍රාත් - 2007 ජනවාරි 2 වන (සංශෝධිත) සංස්කරණය |
| ICTAD/SBD/02(Vol. 1)<br>අයිසීටීඒඩී/එස්බීඩී/02<br>(1 - වෙළුම) | Standard Bidding Document - Major Contracts (Volume - 1)<br>ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛනය - ප්‍රධාන කොන්ත්‍රාත් (1 - වෙළුම) |
| ICTAD/SBD/02(Vol. 2)<br>අයිසීටීඒඩී/එස්බීඩී/02<br>(2 - වෙළුම) | Standard Bidding Document - Major Contracts (Volume -2) - CD<br>ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛනය - ප්‍රධාන කොන්ත්‍රාත් (2 - වෙළුම) සීඩී |
| ICTAD/SBD/03<br>අයිසීටීඒඩී/එස්බීඩී/03 | Standard Bidding Document - Minor Contracts - [2nd Edition (Revised) - January 2007]<br>ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛනය - සුළු කොන්ත්‍රාත් - 2007 ජනවාරි 2 වන (සංශෝධිත) සංස්කරණය |
| ICTAD/SBD/03(Vol. 1)<br>අයිසීටීඒඩී/එස්බීඩී/03<br>(1 - වෙළුම) | Standard Bidding Document - Minor Contracts (Volume - 1)<br>ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛනය - සුළු කොන්ත්‍රාත් (1 - වෙළුම) |
| ICTAD/SBD/03(Vol. 2)<br>අයිසීටීඒඩී/එස්බීඩී/03<br>(2 - වෙළුම) | Standard Bidding Document - Minor Contracts (Volume - 2) - CD<br>ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛනය - සුළු කොන්ත්‍රාත් (2 - වෙළුම) සීඩී |
| ICTAD/SBD/04<br>අයිසීටීඒඩී/එස්බීඩී/04 | Standard Bidding Document - Design and Build Contracts (1st Edition (Revised) May 2003)<br>ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛනය - නිර්මාණ සහ ඉදිකිරීම් කොන්ත්‍රාත් - 2003 මැයි (සංශෝධිත) 1 වන සංස්කරණය |
| ICTAD/SBD/04(Vol. 2)<br>අයිසීටීඒඩී/එස්බීඩී/04<br>(2 - වෙළුම) | Standard Bidding Document - Design and Build Contracts (Volume - 2) - CD<br>ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛනය - නිර්මාණ සහ ඉදිකිරීම් කොන්ත්‍රාත් (2 - වෙළුම) සීඩී |
| ICTAD/SBD/05 | ඉදිකිරීම් ටෙන්ඩර් පිළිබඳ සම්මත ලේඛ්‍යය - කුඩා පරිමාණයේ කොන්ත්‍රාත් (විමසුම සඳහා පමණි) |
| ICTAD/SBD/06 | *நியம கூறலுக்கான ஆவணம் - வேலைகள் தேடி வழங்கல் - சிறிய ஒப்பந்தங்கள் (தேவை நோக்கீட்டிற்கு மட்டும்)* |

*III කොටස (සම්බන්ධිතයි)*

අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කරන ලද සම්මත ලේඛනවල ලැයිස්තුව

| *ප්‍රකාශන අංකය* | *ප්‍රකාශනයේ නම* |
|---|---|
| CIDA/CE/107<br>සීඅයිඩීඒ/සීඊ/107 | Civil Engineering Standard Method of Measurement Sri Lanka (CESMM-SL)<br>ශ්‍රී ලංකා සිවිල් ඉංජිනේරු සම්මත මැනුම් ක්‍රම (සීඊඑස්එම්එම් - එස්එල්) |
| CIDA/SP/102<br>සීඅයිඩීඒ/එස්පී/102 | Specification for Irrigation & Land Drainage - [1st Edition January 2017]<br>වාරිමාර්ග සහ ඉඩම් ජලාපවහන පිරිවිතර - (2017 ජනවාරි 1 වන සංස්කරණය) |
| SCA/3/2<br>එස්සීඒ/3/2 | Specification for Water Supply Sewerage and Storm Water Drainage - [2nd Edition (Revised) - April 2002]<br>ජල සැපයුම් ජලාපවහන සහ කාණු පද්ධති සඳහා වූ පිරිවිතර - 2002 අප්‍රේල් (සංශෝධිත) 2 වන සංස්කරණය |
| SCA/3/3<br>එස්සීඒ/3/3 | Specification for Reclamation Works - [2nd Edition (Revised) - December 1999]<br>ප්‍රතිසංස්කරණ වැඩ සඳහා වූ පිරිවිතර (1999 දෙසැම්බර් (සංශෝධිත) 2 වන සංස්කරණය |
| SCA/3/4<br>එස්සීඒ/3/4 | Specification for Ground Water Exploration and Exploitation - [2nd Edition (Revised) - May 1999]<br>භූ ජල ගවේෂණය සහ උපයෝජනය සඳහා පිරිවිතර (1999 මැයි (සංශෝධිත) 2 වන සංස්කරණය |
| SCA/4/I<br>එස්සීඒ/4/I | Specification for Building Works (Vol. I) - [3rd Edition (Revised) - July 2004]<br>ගොඩනැගිලි වැඩ සඳහා වූ පිරිවිතර (1 - වෙළුම) (2004 ජූලි (සංශෝධිත) 3 වන සංස්කරණය) |
| SCA/4/II<br>එස්සීඒ/4/II | Specification for Building Works (Vol. II) - [2nd Edition (Revised) - October 2001]<br>ගොඩනැගිලි වැඩ සඳහා වූ පිරිවිතර (11 - වෙළුම) (2001 ඔක්තෝබර් (සංශෝධිත) 2 වන සංස්කරණය) |
| SCA/5<br>එස්සීඒ/5 | Standard Specifications for Construction and Maintenance of Roads and Bridges [2nd Edition - June 2009)<br>පාරවල් සහ පාලම් ඉදිකිරීම් සහ නඩත්තු සඳහා වූ සම්මත පිරිවිතර - (2009 ජූනි 2 වන සංස්කරණය) |
| SCA/6<br>එස්සීඒ/6 | Specification for Coastal and Habour Engineering Works - [2nd Edition (Revised) - June 2008]<br>වෙරළ සහ වරාය ඉංජිනේරු වැඩ සඳහා වූ පිරිවිතර (2008 ජූනි (සංශෝධිත) 2 වන සංස්කරණය) |
| SCA/7<br>එස්සීඒ/7 | Specification for Landscape Works - Volume I<br>භූමිතල දර්ශන වැඩ සඳහා පිරිවිතර (1 - වෙළුම) |
| SCA/8<br>එස්සීඒ/8 | Specification for Electrical and Mechanical Works - [2nd Edition (Revised) - August 2000]<br>විද්‍යුත් යාන්ත්‍රික වැඩ සඳහා වූ පිරිවිතර (2000 අගෝස්තු (සංශෝධිත) 2 වන සංස්කරණය) |
| SCA/9<br>එස්සීඒ/9 | Specification for Fire Detection, Protection & Supression Systems<br>ගිනි ආවරණ, ආරක්ෂක සහ මැඩපැවැත්වීමේ පද්ධති සඳහා වූ පිරිවිතර |
| CIDA/SP/101<br>සීඅයිඩීඒ/එස්පී/101 | Specification for Board and Cast In-Situ Reinforced Concrete Piles<br>පලක සහ ශක්තිමත් කළ කොන්ක්‍රීට් කණු එතැනම වාත්තු කිරීම සඳහා වූ පිරිවිතර |
| ICTAD/DEV/17<br>අයිසීටීඒඩී/ඩීඊවී/17 | Specification for Site Investigation for Building Works and Sample Bill of Quantities [1st Edition - April 1997]<br>ගොඩනැගිලි වැඩ සහ ආදර්ශ ප්‍රමාණ පත්‍ර වෙනුවෙන් වූ ස්ථානීය විමර්ශන සඳහා වූ පිරිවිතර (1997 අප්‍රේල් 1 වන සංස්කරණය) |

02 - 649/1

එල්.ඩී.බී. 15/2014

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 35 වන වගන්තියේ (1), (2), සහ (4) වන උපවගන්ති යටතේ නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

සජිත් ප්‍රේමදාස,
නිවාස සහ ඉදිකිරීම් අමාත්‍ය.

2018 ජනවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2017 අංක 1 දරන ''ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ) නියෝග'' යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. සෑම කොන්ත්‍රාත්කරුම (මෙහි මින්මතු ''අධිකාරිය'' ලෙස හඳුන්වනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වීම සඳහා අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරුද සමග අයදුම්පතක් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. කොන්ත්‍රාත්කරුවකු ලෙස ලියාපදිංචි වීම සඳහා වන නිර්ණායක මෙම නියෝගවල පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

4. අධිකාරියේ ලියාපදිංචි වූ යම් කොන්ත්‍රාත්කරුවකු ට, එම කොන්ත්‍රාත්කරුවා විසින් මෙම නියෝගවල දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ ගාස්තු ගෙවීමෙන් පසු ව, ලියාපදිංචි කිරීමේ අංකයක් සහ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, එම සහතිකයේ එය වලංගු වන්නා වූ කාලසීමාව නිශ්චිතව දක්වා තිබිය යුතු ය.

5. අධිකාරියේ ලියාපදිංචි වූ සෑම සුදුසුකම්ලත් තැනැත්තකු ම, එම ලියාපදිංචියෙහි කාල සීමාව ඉකුත්වීමට පෙරාතුව, එම සහතිකය අලුත් කිරීම සඳහා මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ ගාස්තු ද සමග අධිකාරිය වෙත අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

**උපලේඛනය 1**

***ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා නිර්ණායක***

(1) වන වගන්තිය යටතේ දක්වා ඇති නිර්ණායක සපුරාලන අපේක්ෂක ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (ඉ.ක.ස.) අධිකාරියේ ලියාපදිංචිය සඳහා සුදුසුකම් ලබන්නේ ය. ලියාපදිංචි කිරීම සහ ශ්‍රේණිගත කිරීම, කොන්ත්‍රාත්කරුවන්ගේ ව්‍යාපෘති සිදුකිරීමේ හැකියාව පෙන්නුම් කරන්නා වූ එකිනෙකට වෙනස් ඉදිකිරීම් කාණ්ඩ යටතේ සහ විවිධ මූල්‍ය සීමාවන් තුළ සිදුකරනු ලැබේ. එය (2) වන වගන්තිය යටතේ විස්තර කොට ඇත. ඇගයීම් ක්‍රමවේදයේ ව්‍යුහය (3) වන වගන්තියෙන් විස්තර කරනු ලබයි. ශ්‍රේණි තෝරාගැනීම සඳහා යොදාගනු ලබන මූලික ලකුණු ක්‍රමවේදය (4) වන වගන්තියේ සියලු කාණ්ඩ සඳහා වගු ආකාරයෙන් දක්වා ඇත. ලකුණු ලබාදීමේ මෙහෙයුම් විස්තර වගු (අ) සිට (ඔ) දක්වා ලැයිස්තු ගත කර ඇත.

ප්‍රධාන (ගොඩනැගිලි සහ සිවිල් ඉංජිනේරු), විශේෂඥතා (විදුලි යාන්ත්‍රික, විශේෂිත සහ හු තාක්ෂණික ජම්බාර ගැසීම්වල නියුතු) ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ විස්තරාත්මක නිර්ණායක පුස්තිකා තුනක් (03) ලෙස ප්‍රකාශයට පත්කර ඇති අතර කර්මාන්තයේ භාවිතය සඳහා ඉ.ක.ස. අධිකාරියේ තොරතුරු මධ්‍යස්ථානයෙන් ලබාගත හැක.

**1.0 ලියාපදිංචිය සඳහා යෝග්‍යතාව**

ඉ.ක.ස. අධිකාරියේ ලියාපදිංචිය සඳහා අයදුම්කරන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් :

1.1 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සමාගම් ලේඛකාධිකාරී සමග හෝ ව්‍යාපාර නාම ආඥාපනත/පළාත් ව්‍යාපාර නාම ප්‍රඥප්ති යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක ඉදිකිරීම් ව්‍යාපාර කටයුතු සිදුකිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී සිටිය යුතු ය.

''ප්‍රජා මූල සංවිධාන'' අදාළ අධිකාරියක් විසින් එහි ලියාපදිංචිය සඳහා නිකුත් කරනු ලැබූ වලංගු ව්‍යවස්ථාපිත ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතු ය.

1.2 හිමිකාරිත්වයෙන් යටත් පිරිසෙයින් 51% ක් ශ්‍රී ලාංකිකයන්ට තිබිය යුතු ය.

1.3 මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව හෝ වෙනත් යම් රාජ්‍ය ආයතනයක් විසින් පවත්වාගෙන යනු ලබන අත්හිටුවනු ලැබූ හෝ ගිවිසුම් කඩකර ඇති ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවේ ඇතුළත් නොවිය යුතු ය.

1.4 අයදුම් කරන අවස්ථාවේ නෛතිකව බුන්වත් හෝ බංකොලොත් ලෙස ප්‍රකාශයට පත් නොකොට තිබිය යුතු ය.

සටහන :- දේශීය ප්‍රාග්ධන වෙළඳ පොළේ ලැයිස්තු ගත කර ඇති පොදු බැඳීම් සමාගම් හෝ පොදු බැඳීම් සමාගම්වලට මුළුමණින්ම හෝ අර්ධ වශයෙන් අයත් ආයතන, ඉහත 1.2 යටතේ බැඳීම්/අවශ්‍යතා සපුරාලමින් තම මුල් ලියාපදිංචිය ලබාගැනීමෙන් පසු, ඔවුන්ගේ කොටස් දේශීය සහ විදේශීය ආයෝජකයන් මිලදී ගනු ලබනු ඇතැයි යන කරුණ සැලකිල්ලට ගනිමින්, මීළඟ අලුත් කිරීම/ලියාපදිංචිය අතරතුරදී දේශීය හිමිකාරිත්වයෙන් 51% ක හිමිකම් තිබීමට අවශ්‍ය නොවනු ඇත. කෙසේ වෙතත්, එම පොදු බැඳීම් සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලවල දේශීය අධ්‍යක්ෂවරුන්ගේ 51% කට වැඩි දේශීය නියෝජනයක් තිබිය යුතු ය.

2.0 ව්‍යාපාර ධාරිතා සීමාවන් සහිත ලියාපදිංචි කිරීමේ සහ ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදය

ලියාපදිංචි කිරීම සහ ශ්‍රේණිගත කිරීම සඳහා ප්‍රධාන කාණ්ඩ දෙකක් යටතේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සලකා බලනු ලැබේ, එනම්, ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සහ විශේෂඥ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්

2.1 ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ශ්‍රේණි 11 ක් යටතේ (CS 2 සිට C9 ) සහ විශේෂතා ක්ෂේත්‍ර 9 ක් යටතේ ලියාපදිංචි කරනු ලැබේ.

| ශ්‍රේණිය | මූල්‍ය සීමාව (X)<br>රු. මිලියන |
|---|---|
| CS 2 | X > 3000 |
| CS 1 | 3000 ≥ X>1500 |
| C 1 | 1500 ≥ X>600 |
| C2 | 600 ≥ X>300 |
| C3 | 300 ≥ X>150 |
| C4 | 150 ≥ X>50 |
| C5 | 50 ≥ X>25 |
| C6 | 25 ≥ X>10 |
| C7 | 10 ≥ X>05 |
| C8 | 05 ≥ X>02 |
| C9 | 02 ≥ X |

ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් යටතේ ලියාපදිංචි කිරීම් විශේෂතා

අ. ගොඩනැගිලි
ආ. මහා මාර්ග
ඇ. පාලම්
ඈ. ජල සම්පාදන සහ මලාපවහන
ඉ. වාරිමාර්ග සහ ජලාපවහන ඇල මාර්ග
ඊ. මඩ කැණීම සහ ඉඩම් ගොඩ කිරීම
උ. වැසි ජලය බැහැර කිරීම සහ භූ ජල අපවහනය
ඌ. සමුද්‍රීය ඉදිකිරීම්
එ. මහා පරිමාණයේ ඉදිකිරීම් (ක්ෂේත්‍ර නිශ්චිතව දැක්විය යුතුයි)

2.2 විශේෂඥතා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් (3) යටතේ ලියාපදිංචි කරනු ලැබේ.

2.2.1 විදුලි සහ යාන්ත්‍රික සේවා (EM)

විදුලි සහ යාන්ත්‍රික සේවා සපයන ආයතන EM කාණ්ඩය යටතේ වර්ගීකරණය කරනු ලබන අතර ශ්‍රේණි පහක් (5) (EM1 - EM5) සහ අදාළ විශේෂතා දොළහක් (12) යටතේ ලියාපදිංචි කරනු ඇත.

| ශ්‍රේණිය | මූල්‍ය සීමාව (X)<br>රු. මිලියන |
|---|---|
| EM1 | X > 50 |
| EM2 | 50 ≥ X>25 |
| EM3 | 25 ≥ X>10 |
| EM4 | 10 ≥ X>02 |
| EM5 | 02 ≥ X |

විදුලි සහ යාන්ත්‍රික සේවා යටතේ ලියාපදිංචි කිරීම් විශේෂතා

- අ. විදුලි ස්ථාපන (අඩු වෝල්ටීයතාවය) (EL-LV)
- ආ. විදුලි ස්ථාපන (මධ්‍යම වෝල්ටීයතාවය) (EI-MV)
- ඇ. විදුලි සෝපාන, විදුලි තරප්පු පෙළ සහ ට්‍රැවලේටර (EET)
- ඈ. අති අඩු වෝල්ටීයතා ස්ථාපන (දත්ත, විදුලි සංදේශ, ආරක්ෂක පද්ධති, මහජන ඇමතුම් පද්ධති, නල සංගීත පද්ධති) (ELV)
- ඉ. ගිනි සෙවීම්, ආරක්ෂණ සහ මැඩලීම (F DPS)
- ඊ. විදුලි උත්පාදක යන්ත්‍ර (Gen)
- උ. බර වාහනේ සැකසුම්කරණය (HSF)
- ඌ. ද්‍රවීකෘත පෙට්රෝලියම් ගෑස් පද්ධති (LPG)
- එ. යාන්ත්‍රික සංවාතනය සහ වායු සමනය (MVAC)
- ඒ. වෛද්‍ය වායු පද්ධති (MG)
- ඔ. නළ වැඩ සහ ජල අපවහනය (PD)
- ඕ. ශීත කරණය (RF)

2.2.2 විශේෂිත ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෝ

නිමැයුම් වැඩ සහ අනෙකුත් විශේෂිත ශිල්ප ක්ෂේත්‍රවල නිරත ආයතන විශේෂිත ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් යටතේ ලියාපදිංචි කරනු ලබන අතර ශ්‍රේණි පහක් (5) (SP1 - SP5) සහ විශේෂතා නවයක් (9) යටතේ ලියාපදිංචි කරනු ලැබේ.

| ශ්‍රේණිය | මූල්‍ය සීමාව (X)<br>රු. මිලියන |
|---|---|
| SP1 | X > 50 |
| SP2 | 50 ≥ X>25 |
| SP3 | 25 ≥ X>10 |
| SP4 | 10 ≥ X>02 |
| SP5 | 02 ≥ X |

විශේෂිත ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෝ පහත දැක්වෙන විශේෂතා ක්ෂේත්‍ර යටතේ ලියාපදිංචි කරනු ලැබේ.

- අ. ඇලුමිනියම් සහ නිමැයුම් (A&F)
- ආ. වඩුකාර්මික සහ වැද්දුම් වැඩ (Carp)
- ඇ. පොළොව, බිත්ති සහ සිවිලිං නිමයුම් (FW&C) (නිමැයුම නිශ්චිතව දැක්විය යුතුය)
- ඈ. ගෘහභාණ්ඩ, සවිකුරු සහ උපකරණ (FF&E)
- ඉ. භූමි අලංකරණය (LA)
- ඊ. සැහැල්ලු ලෝහ වැඩ (ME)
- උ. පස ඇණලෑම සහ ස්ථායී කිරීම (SN)
- ඌ. පිහිනුම් තටාක (SP)
- එ. ජල රෝධනය (WP)

2.2.3 භූ තාක්ෂණික ජම්බාර ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෝ (GP)

ජම්බාර ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සහ ශ්‍රේණිගත කිරීම සඳහා ප්‍රධාන කාණ්ඩ 02 ක් යටතේ සලකා බලනු ලැබේ. එනම් ; භූ තාක්ෂණික ජම්බාර - පෙරනිම් (GP-P) සහ භූ තාක්ෂණික ජම්බාර - විදිපිරි ටැඹ (GP-B)

| ශ්‍රේණිය | මූල්‍ය සීමාව (X) රු. මිලියන |
|---|---|
| GP-P | X ≥ 50 |
| GP-B1 | X>150 |
| GP-B2 | 150 ≥ X>50 |
| GP-B3 | 50 ≥ X>10 |
| GP-B4 | 10 ≥ X |

සටහන : කොන්ත්‍රාත්කරුවකුගේ මූල්‍ය සීමාව හෝ ධාරිතා සීමාව යනු වත්මන් කොන්ත්‍රාත්කරුවකු විසින් එක් වරකට සිදුකළ හැකි ව්‍යාපෘතිවල උපරිම වටිනාකමයි. ප්‍රසම්පාදන පටිපාටි/ටෙන්ඩර් ප්‍රදානය කිරීම් අතුරතුරදී ඇගයීම සඳහා දැනට සිදුකරන ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඉල්ලා සිටිනු ලැබුවහොත් කොන්ත්‍රාත්කරු එම අදාළ සියලු තොරතුරු අදාළ සේවාලාභීන්ට ලබා දිය යුතු ය.

3.0 ප්‍රධාන ඇගයීම් ක්ෂේත්‍ර

පහත දැක්වෙන වැදගත් ක්ෂේත්‍ර යටතේ කොන්ත්‍රාත්කරුගේ යෝග්‍යතාවය ඇගයීමට ලක්කරනු ලැබේ.

3.1 මූල්‍ය ධාරිතාවය

3.1.1 කාරක ප්‍රාග්ධනය/ශුද්ධ වත්කම

3.1.2 බැංකු ගිණුම් සහ බැංකුවලින් මූල්‍ය පහසුකම් (ස්ථිර අයිරා පහසුකම් - ඉල්ලූ විට ගෙවීම, ණයවර ලිපි, ඇප පහසුකම් ආදිය)

3.2 තාක්ෂණික ධාරිතාවය

3.2.1 මානව සම්පත්

(අ) වෘත්තික සහ අනෙකුත් තාක්ෂණික කාර්ය මණ්ඩලය

(ආ) අධීක්ෂණ කාර්ය මණ්ඩලය

(ඇ) ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 3 සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලය

3.2.2 කාර්ය පළපුරුද්ද

(අ) පසුගිය වසර 5 තුළ ඉදිකිරීම් පිරිවැටුම

(ආ) පසුගිය වසර 5 තුළ සම්පූර්ණ කරන ලද විශාලතම අදාළ ව්‍යාපෘතිය/කොන්ත්‍රාත්තුව

3.3 යන්ත්‍රෝපකරණ සහ උපකරණ

* මෙය අනිවාර්ය නොවේ

* C3 සහ ඉන් ඉහළ ශ්‍රේණිවලට අතිරේක ලකුණු ලබාගත හැක

3.4 සලකා බැලිය යුතු අනෙකුත් කරුණු

3.4.1 සංවිධානය/ආයතනය

(අ) හිමිකරුවන්ගේ/අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම්

(ආ) සාමාන්‍ය කළමනාකරණ කාර්ය මණ්ඩලය

(ඇ) සංවිධානයේ පළපුරුද්ද

3.4.2 සංවිධානමය කළමනාකරණය

3.4.2.1 පද්ධති කළමනාකරණය

(අ) වත්මන් ISO 9000 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකකරණය තිබීම (CS2, CS1, C1, C2, C3 ශ්‍රේණි සඳහා අනිවාර්ය වේ)

(ආ) වත්මන් ISO 14000 පාරිසරික කළමනාකරණ පද්ධති සහතිකකරණය තිබීම (CS2, CS1, ශ්‍රේණි සඳහා අනිවාර්ය වේ)

(ඇ) වත්මන් OHSAS 18000 වෘත්තීයමය සෞඛ්‍ය සහ සුරක්ෂිතතා පද්ධති සහතිකකරණය තිබීම (CS2, CS1, ශ්‍රේණි සඳහා අනිවාර්ය වේ)

3.4.2.2 ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීයමය සෞඛ්‍යය
3.4.2.3 අඛණ්ඩ ඉදිකිරීම් නිපුණතා සංවර්ධනය
3.4.2.4 ඉදිකිරීම් විශිෂ්ටතා සම්මාන
3.4.2.5 බාහිර අභ්‍යාසලාභීන් සඳහා පුහුණුව සැපයීම
3.4.2.6 ආයතනික සමාජ වගකීම (ආ.ස.ව.) ලකුණු ක්‍රමයකට අනුව ඇගයීම සිදුකරනු ලැබේ.

4.0 අවම ලකුණු අවශ්‍යතා

4.1 ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෝ

| ශ්‍රේණි ගත කිරීම | 1.0 මූල්‍ය ධාරිතාවය | | 2.0 තාක්ෂණික ධාරිතාවය | | | | | | | 3.0 සලකා බැලිය යුතු අනෙකුත් කරුණු | | අවශ්‍ය මුළු ලකුණු ප්‍රමාණය (අවම) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2.1.අ. වෘත්තික කාර්ය මණ්ඩලය සහ අනෙකුත් තාක්ෂණික කාර්ය මණ්ඩලය වගුව (අ) බලන්න | 2.1.ආ අධීක්ෂණ කාර්ය මණ්ඩලය වගුව (ඉ) බලන්න | 2.1.ඇ ජා.වෘ.සු. මට්ටම 3 සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය වගුව (ඉ) බලන්න | 2.2 වැඩ පළපුරුද්ද | | | | ISO, OHSAS, ඉදිකිරීම සුරක්ෂිතතාව සහ වෘත්තීමය සෞඛ්‍යය (උ), (ඌ) සහ (ඊ) වගු බලන්න | නිපුණතා සංවර්ධනය, සම්මාන, පුහුණුව, ආ.ස.ව. (එ), (ඒ) සහ (ඔ) වගු බලන්න | |
| | | | | | | 2.2 අ පසුගිය වසර 5 හි පිරිවැටුම | | 2.2 ආ. විශාලතම ව්‍යාපෘතිය | | | | |
| | රු | ලකුණු | ලකුණු | ගණන | ගණන | රු | ලකුණු | රු | ලකුණු | ලකුණු | ලකුණු | |
| C9 ශ්‍රේණිය | මි 0.16 | 0.4 | - | 1.0 | - | | - | | - | - | - | 1.4 |
| C8 ශ්‍රේණිය | මි 0.4 | 1.0 | - | 1.0 | - | | - | | - | - | - | 2.0 |
| C7 ශ්‍රේණිය | මි 0.8 | 2.0 | 2.0 | 1.0 | - | | - | | - | - | - | 5.0 |
| C6 ශ්‍රේණිය | මි 02 | 3.0 | 2.0 | 2.5 | - | මි 30 | 1.5 | මි 4 | 1.0 | - | - | 10.0 |
| C5 ශ්‍රේණිය | මි 04 | 4.0 | 3.0 | 3.5 | - | මි 75 | 3.75 | මි 10 | 2.5 | - | 50.0 | 67.0 |
| C4 ශ්‍රේණිය | මි 12 | 8.0 | 4.0 | 4.0 | - | මි 150 | 7.5 | මි 20 | 5.0 | - | 70.0 | 99.0 |
| C3 ශ්‍රේණිය | මි 24 | 12.0 | 6.0 | 4.0 | - | මි 450 | 22.5 | මි 60 | 9.0 | 32.0 | 100.0 | 186.0 |
| C2 ශ්‍රේණිය | මි 48 | 24.0 | 7.0 | 5.0 | - | මි 900 | 45.0 | මි 180 | 21.0 | 32.0 | 101.0 | 235.0 |
| C1 ශ්‍රේණිය | මි 120 | 60.0 | 12.0 | 8.0 | 10.0 | මි 1800 | 90.0 | මි 360 | 39.0 | 37.0 | 157.0 | 413.0 |
| CS1 ශ්‍රේණිය | මි 240 | 120.0 | 50.0 | 25.0 | 15.0 | මි 4500 | 225.0 | මි 900 | 93.0 | 106.0 | 216.0 | 850.0 |
| CS2 ශ්‍රේණිය | මි 400 | 200.0 | 65.0 | 50.0 | 20.0 | මි 9000 | 450.0 | මි 1800 | 183.0 | 106.0 | 235.0 | 1310.0 |

සටහන : C2 සහ ඉන් පහළ ශ්‍රේණි සඳහා පමණක් පහත සඳහන් දෑ අදාළ වේ (C1, CS1, CS2 සඳහා අදාළ නොවේ.)
මූල්‍ය ධාරිතාවය, සම්පූර්ණ කරන ලද විශාලතම ව්‍යාපෘතිය සහ මුළු ලකුණු හැර වෙනත් කවර හෝ ක්ෂේත්‍රයක අවශ්‍යතාවයෙන් 75% ක් සපුරාලීම මගින් ශ්‍රේණි ලබාගත හැක.

4.2 විශේෂඥ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෝ

4.2.1 විදුලි සහ යාන්ත්‍රික සේවා (EM)

| ශ්‍රේණි ගත කිරීම | 1.0 මූල්‍ය ධාරිතාවය | | 2.0 තාක්ෂණික ධාරිතාවය | | | | | | | 3.0 සලකා බැලිය යුතු අනෙකුත් කරුණු | | අවශ්‍ය මුළු ලකුණු ප්‍රමාණය (අවම) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2.1.අ. වෘත්තික කාර්ය මණ්ඩලය සහ අනෙකුත් තාක්ෂණික කාර්ය මණ්ඩලය වගුව (අ) බලන්න | 2.1.ආ අධීක්ෂණ කාර්ය මණ්ඩලය වගුව (ඉ) බලන්න | 2.1.ඇ ජා.වෘ.සු. මට්ටම 3 සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය වගුව (ඉ) බලන්න | 2.2 වැඩ පළපුරුද්ද | | | | ISO, OHSAS, ඉදිකිරීම සුරක්ෂිතතාව සහ වෘත්තීමය සෞඛ්‍යය (උ), (ඌ) සහ (ඊ) වගු බලන්න | නිපුණතා සංවර්ධනය, සම්මාන, පුහුණුව, ආ.ස.ව. (එ), (ඒ) සහ (ඔ) වගු බලන්න | |
| | | | | | | 2.2 අ පසුගිය වසර 5 හි පිරිවැටුම | | 2.2 ආ. විශාලතම ව්‍යාපෘතිය | | | | |
| | රු | ලකුණු | ලකුණු | ගණන | ගණන | රු | ලකුණු | රු | ලකුණු | ලකුණු | ලකුණු | |
| EM1 ශ්‍රේණිය | මි 12 | 8.0 | 4.0 | 4.5 | 3.0 | මි 180 | 9.0 | මි 25 | 6.25 | 35.0 | 110.0 | 180.0 |
| EM2 ශ්‍රේණිය | මි 4 | 4.0 | 3.0 | 3.0 | - | මි 80 | 4.0 | මි 12 | 3.0 | - | 70.0 | 88.0 |
| EM3 ශ්‍රේණිය | මි 2 | 3.0 | 2.0 | 3.0 | - | මි 40 | 2.0 | මි 6 | 1.5 | - | 20.0 | 32.0 |
| EM4 ශ්‍රේණිය | මි 1.0 | 2.5 | 2.0 | 2.0 | - | - | - | - | - | - | 10.0 | 17.0 |
| EM5 ශ්‍රේණිය | මි 0.2 | 0.5 | - | 1.0 | - | - | - | - | - | - | - | 1.5 |

සටහන : EM2 සහ ඉන් පහළ ශ්‍රේණි සඳහා පමණක් පහත සඳහන් දෑ අදාළ වේ (EM1 සඳහා අදාළ නොවේ.)
මූල්‍ය ධාරිතාවය, සම්පූර්ණ කරන ලද විශාලතම ව්‍යාපෘතිය සහ මුළු ලකුණු හැර වෙනත් කවර හෝ ක්ෂේත්‍රයක අවශ්‍යතාවයෙන් 75% ක් සපුරාලීම මගින් ශ්‍රේණි ලබාගත හැක.

4.2.2 විශේෂිත ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෝ

4.2.2.1 ඇලුමිනියම් සහ නිමැයුම් (A&F), ජල රෝධනය (WP), පිහිනුම් තටාක (SP), පස ඇනලෑම සහ ස්ථායී කිරීම (SN)

| ශ්‍රේණි ගත කිරීම | 1.0 මූල්‍ය ධාරිතාවය | | 2.0 තාක්ෂණික ධාරිතාවය | | | | | | | | | 3.0 සලකා බැලිය යුතු අනෙකුත් කරුණු | | අවශ්‍ය මුළු ලකුණු ප්‍රමාණය (අවම) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2.1.අ. වෘත්තික කාර්ය මණ්ඩලය සහ අනෙකුත් තාක්ෂණික කාර්ය මණ්ඩලය වගුව (ඇ) බලන්න | | 2.1.ආ අධීක්ෂණ කාර්ය මණ්ඩලය {වගුව (ඉ) බලන්න} | 2.1.ඇ ජා.වෘ.සු. මට්ටම 3 සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය {වගුව (ඉ) බලන්න} | 2.2 වැඩ පළපුරුද්ද | | | | | ISO, OHSAS, ඉදිකිරීම සුරක්ෂිතතාව සහ වෘත්තීමය සෞඛ්‍යය (උ), (ඌ) සහ (ඊ) {වගු බලන්න} | නිපුණතා සංවර්ධනය, සම්මාන, පුහුණුව, ආ.ස.ව. (එ), (ඒ) සහ (ඔ) {වගු බලන්න} | |
| | | | | | | | 2.2 අ පසුගිය වසර 5හි පිරිවැටුම | | | 2.2 ආ. විශාලතම ව්‍යාපෘතිය | | | | |
| | රු | ලකුණු | පිරිස් | ලකුණු | පිරිස් | ලකුණු | ලකුණු | රු | ලකුණු | රු | ලකුණු | ලකුණු | ලකුණු | |
| SP1 ශ්‍රේණිය | මි 12 | 8.0 | විද්‍යාවේදි සිවිල්/ යාන්ත්‍රික ඉංජිනේරු වසර 5ක පළපුරුද්ද එක් අයෙකු (01) හෝ වසර 10 ක පළපුරුද්ද සමග ජා.තා.ඩි. | 3.0 | තාක්ෂණික සහකාර ජා.තා.ඩි, ඉ.උ.ජා.ඩි. (සිවිල්/ යාන්ත්‍රික) වසර 3 ක පළපුරුද්ද හෝ සමාන තිදෙනෙක් (03) | 4.5 | 3.0 | මි 180 | 9.0 | මි 24 | 3.75 | 30.0 | 110.0 | 173.3 |
| SP2 ශ්‍රේණිය | මි 4 | 4.0 | | 3.0 | - | 3.0 | - | මි 60 | 3.0 | මි 12 | 2.5 | - | 50.0 | 66.0 |
| SP3 ශ්‍රේණිය | මි 2 | 3.0 | | 2.0 | - | 3.0 | - | - | - | මි 6 | 1.5 | - | - | 10.0 |
| SP4 ශ්‍රේණිය | මි 1.0 | 2.5 | | 2.0 | - | 2.0 | - | - | - | - | - | - | - | 6.5 |
| SP5 ශ්‍රේණිය | මි 0.2 | 0.5 | - | - | - | 1.0 | - | - | - | - | - | - | - | 1.5 |

සටහන : SP2 සහ ඉන් පහළ ශ්‍රේණි සඳහා පමණක් පහත සඳහන් දෑ අදාළ වේ (SP1 සඳහා අදාළ නොවේ.)
මූල්‍ය ධාරිතාවය, සම්පූර්ණ කරන ලද විශාලතම ව්‍යාපෘතිය සහ මුළු ලකුණු හැර වෙනත් කවර හෝ ක්ෂේත්‍රයක අවශ්‍යතාවයෙන් 75% ක් සපුරාලීම මගින් ශ්‍රේණි ලබාගත හැක.

4.2.2.2 පොළොව, බිත්ති සහ සිවිලිම (FW&C), වඩුවැඩ සහ වැද්දුම් (Carp), සැහැල්ලු ලෝහ වැඩ (ME), භූමි අලංකරණය (LA), ගෘහ භාණ්ඩ, සවිකුරු සහ උපකරණ (FF&E)

| ශ්‍රේණි ගත කිරීම | 1.0 මූල්‍ය ධාරිතාවය | | 2.0 තාක්ෂණික ධාරිතාවය | | | | | | 3.0 සලකා බැලිය යුතු අනෙකුත් කරුණු | | අවශ්‍ය මුළු ලකුණු ප්‍රමාණය (අවම) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2.1.ඉ අධීක්ෂණ කාර්ය මණ්ඩලය {වගුව (ඉ) බලන්න} | 2.1.ඇ ජා.වෘ.සු. මට්ටම 3 සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය වගුව (ඉ) බලන්න | 2.2 වැඩ පළපුරුද්ද | | | | ISO, OHSAS, {(උ) වගුව බලන්න} | නිපුණතා සංවර්ධනය, සම්මාන, පුහුණුව, ආ.ස.ව. {(එ), (ඒ) සහ (ඔ) වගු බලන්න} | |
| | | | | | 2.2 අ පසුගිය වසර 5 හි පිරිවැටුම | | 2.2 ආ. විශාලතම ව්‍යාපෘතිය | | | | |
| | රු | ලකුණු | ගණන | ගණන | රු | ලකුණු | රු | ලකුණු | ලකුණු | ලකුණු | |
| SP1 ශ්‍රේණිය | මි 12 | 8.0 | 3.0 | 3.0 | මි 180 | 9.0 | මි 24 | 3.75 | 30.0 | 110.0 | 167.0 |
| SP2 ශ්‍රේණිය | මි 4 | 4.0 | 2.0 | - | මි 60 | 3.0 | මි 12 | 2.5 | - | 50.0 | 62.0 |
| SP3 ශ්‍රේණිය | මි 2 | 3.0 | 2.0 | - | - | - | මි 6 | 1.5 | - | - | 7.0 |
| SP4 ශ්‍රේණිය | මි 1.0 | 2.5 | 1.0 | - | - | - | - | - | - | - | 3.5 |
| SP5 ශ්‍රේණිය | මි 0.2 | 0.5 | 1.0 | - | - | - | - | - | - | - | 1.5 |

සටහන : SP2 සහ ඉන් පහළ ශ්‍රේණි සඳහා පමණක් පහත සඳහන් දෑ අදාළ වේ (SP1 සඳහා අදාළ නොවේ.)
මූල්‍ය ධාරිතාවය, සම්පූර්ණ කරන ලද විශාලතම ව්‍යාපෘතිය සහ මුළු ලකුණු හැර වෙනත් කවර හෝ ක්ෂේත්‍රයක අවශ්‍යතාවයෙන් 75% ක් සපුරාලීම මගින් ශ්‍රේණි ලබාගත හැක.

4.2.3 භූ තාක්ෂණික ජම්බාර ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෝ

4.2.3.1 භූ තාක්ෂණික ජම්බාර - පෙර නිමි (GEO TECHNICAL PILING - PRE CAST)

| ශ්‍රේණි ගත කිරීම | 1.0 මූල්‍ය ධාරිතාවය | | 2.0 තාක්ෂණික ධාරිතාවය | | | | | | | 3.0 සලකා බැලිය යුතු අනෙකුත් කරුණු | | අවශ්‍ය මුළු ලකුණු ප්‍රමාණය (අවම) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2.1.අ. වෘත්තික කාර්ය මණ්ඩලය සහ අනෙකුත් තාක්ෂණික කාර්ය මණ්ඩලය {වගුව (අ) බලන්න} | 2.1.ආ අධීක්ෂණ කාර්ය මණ්ඩලය {වගුව (ඉ) බලන්න} | 2.1.ඇ ජා.වෘ.සු. මට්ටම 3 සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය {වගුව (ඉ) බලන්න} | 2.2 වැඩ පළපුරුද්ද | | | | ISO, OHSAS, ඉදිකිරීම සුරක්ෂිතතාව සහ වෘත්තීමය සෞඛ්‍යය {(උ), (ඌ) සහ (ඊ) වගු බලන්න} | නිපුණතා සංවර්ධනය, සම්මාන, පුහුණුව, ආ.ස.ව. {(එ), (ඒ) සහ (ඔ) වගු බලන්න} | |
| | | | | | | 2.2 අ පසුගිය වසර 5 හි පිරිවැටුම | | 2.2 ආ. විශාලතම ව්‍යාපෘතිය | | | | |
| | රු | ලකුණු | ලකුණු | ගණන | ගණන | රු | ලකුණු | රු | ලකුණු | ලකුණු | ලකුණු | |
| GP-P ශ්‍රේණිය | මි 20 | 10.0 | 6.0 | 6.0 | 3.0 | මි 150 | 7.5 | මි 35 | 6.5 | 144.0 | 80.0 | 263.0 |

4.2.3.2 භූ තාක්ෂණික ජම්බාර - විදිපිරි වැඹ (GEO TECHNICAL PILING - BORED CAST INSITU)

| ශ්‍රේණි ගත කිරීම | 1.0 මූල්‍ය ධාරිතාවය | | 2.0 තාක්ෂණික ධාරිතාවය | | | | | | | 3.0 සලකා බැලිය යුතු අනෙකුත් කරුණු | | අවශ්‍ය මුළු ලකුණු ප්‍රමාණය (අවම) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2.1.අ. වෘත්තික කාර්ය මණ්ඩලය සහ අනෙකුත් තාක්ෂණික කාර්ය මණ්ඩලය {වගුව (අ) බලන්න} | 2.1.ආ අධීක්ෂණ කාර්ය මණ්ඩලය {වගුව (ඉ) බලන්න} | 2.1.ඇ ජා.වෘ.සු. මට්ටම 3 සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය {වගුව (ඉ) බලන්න} | 2.2 වැඩ පළපුරුද්ද | | | | ISO, OHSAS, ඉදිකිරීම සුරක්ෂිතතාව සහ වෘත්තීමය සෞඛ්‍යය {(උ), (ඌ) සහ (ඊ) වගු බලන්න} | නිපුණතා සංවර්ධනය, සම්මාන, පුහුණුව, ආ.ස.ව. {(එ), (ඒ) සහ (ඔ) වගු බලන්න} | |
| | | | | | | 2.2 අ පසුගිය වසර 5 හි පිරිවැටුම | | 2.2 ආ. විශාලතම ව්‍යාපෘතිය | | | | |
| | රු | ලකුණු | ලකුණු | ගණන | ගණන | රු | ලකුණු | රු | ලකුණු | ලකුණු | ලකුණු | |
| GP-B1 ශ්‍රේණිය | මි 30 | 15.0 | 9.0 | 9.0 | 3.0 | මි 500 | 25.0 | මි 70 | 10.0 | 144.0 | 80.0 | 295.0 |
| GP-B2 ශ්‍රේණිය | මි 20 | 10.0 | 6.0 | 6.0 | - | මි 150 | 7.5 | මි 35 | 6.5 | 40.0 | 50.0 | 126.0 |
| GP-B3 ශ්‍රේණිය | මි 10 | 7.0 | 3.0 | 3.0 | - | මි 25 | 1.25 | මි 6 | 1.5 | - | - | 16.0 |
| GP-B4 ශ්‍රේණිය | මි 3 | 3.5 | | 3.0 | - | - | - | - | - | - | - | 6.5 |

සටහන : GP-P, GP-B2 සහ ඉන් පහළ ශ්‍රේණි සඳහා පමණක් පහත සඳහන් දෑ අදාළ වේ (GP-B1 සඳහා අදාළ නොවේ.)
මූල්‍ය ධාරිතාවය, සම්පූර්ණ කරන ලද විශාලතම ව්‍යාපෘතිය සහ මුළු ලකුණු හැර වෙනත් කවර හෝ ක්ෂේත්‍රයක අවශ්‍යතාවයෙන් 75% ක් සපුරාලීම මගින් ශ්‍රේණි ලබාගත හැක.

ලකුණු ලබාදීමේ මාර්ගෝපදේශ වගු

*මානව සම්පත්/කාර්ය මණ්ඩලය සඳහා ලකුණු ලබාදීම පිළිබඳ සටහන්*

(1) මෙම කාණ්ඩ සඳහා ලබා දෙන ප්‍රමිතිකරණ හුදෙක්ම මානව සම්පත් පදනම් කරගනිමින් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ඇගයීමේ කාර්යය සඳහා පමණි. මෙය වලංගු වනුයේ ඉ.ක.ස. අධිකාරියේ ලියාපදිංචි වීම සඳහා ලකුණු සඳහා පමණක් වන අතර කිසියම් ජාතික ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයකට/සංසන්දනය කිරීමකදී සැලකිල්ලට නොගත යුතු ය.

(2) පළපුරුද්ද ගණන් ගැනීම ආරම්භ කරනුයේ මූලික උපාධිය/ඩිප්ලෝමාව හෝ සමාන සුදුසුකම ලබා ගත් දින සිටය.

(3) සියලු කාණ්ඩවල ඉංජිනේරුවන් අදාළ ක්ෂේත්‍ර සුදුසුකම් ලබා තිබිය යුතු ය.
(උද : C ශ්‍රේණි සඳහා සිවිල් ඉංජිනේරු, EM ශ්‍රේණි සඳහා විදුලි සහ යාන්ත්‍රික ඉංජිනේරු)

(අ) ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා වෘත්තික සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය

| කාණ්ඩය | ලකුණු |
|---|---|
| වසර 15 ක පළපුරුද්ද සහිත වරලත් ඉංජිනේරු | 06 |
| වසර 15 ක පළපුරුද්ද සහිත වරලත් වාස්තු විද්‍යාඥ | 06 |
| වසර 15 ක පළපුරුද්ද සහිත වරලත් ප්‍රමාණ සමීක්ෂක | 06 |
| වසර 10 ක පළපුරුද්ද සහිත වරලත් ඉංජිනේරු | 05 |
| වසර 10 ක පළපුරුද්ද සහිත වරලත් වාස්තු විද්‍යාඥ | 05 |
| වසර 10 ක පළපුරුද්ද සහිත වරලත් ප්‍රමාණ සමීක්ෂක | 05 |
| වරලත් ඉංජිනේරු | 04 |
| වරලත් වාස්තු විද්‍යාඥ | 04 |
| වරලත් ප්‍රමාණ සමීක්ෂක | 04 |
| දෙපාර්තමේන්තු සුදුසුකම් ලත් ඉංජිනේරු | 04 |
| වසර 6 ක පළපුරුද්ද සහිත උපාධිධාරි හෝ සමාන සුදුසුකම් සහිත ඉංජිනේරු | 04 |
| වසර 10 ක පළපුරුද්ද සහිත සංස්ථාපිත ඉංජිනේරු | 04 |
| උපාධිධාරි හෝ සමාන සුදුසුකම් සහිත ඉංජිනේරු | 03 |
| වාස්තු විද්‍යාඥ | 03 |
| උපාධිධාරී ප්‍රමාණ සමීක්ෂක | 03 |
| සංස්ථාපිත ඉංජිනේරු | 03 |
| ඉංජිනේරු (වෘත්තීය සුදුසුකම් ලත්) | 03 |
| සහකාර ඉංජිනේරු | 02 |
| වාස්තු විද්‍යා අධිකාරපත්‍රලාභී | 02 |
| සහකාර ප්‍රමාණ සමීක්ෂක | 02 |

(ආ) විදුලි යාන්ත්‍රික කාර්යයන් (EM) සඳහා වෘත්තික සහ අනෙකුත් තාක්ෂණික කාර්ය මණ්ඩලය

| කාණ්ඩය | ලකුණු |
|---|---|
| වසර 15 ක පළපුරුද්ද සහිත වරලත් ඉංජිනේරු/වරලත් ගොඩනැගිලි සේවා ඉංජිනේරු ආයතනයේ සාමාජික (CIBSE) (එ.රාජධානිය) | 06 |
| වසර 15 ක පළපුරුද්ද සහිත වරලත් ප්‍රමාණ සමීක්ෂක | 06 |
| වසර 10 ක පළපුරුද්ද සහිත වරලත් ඉංජිනේරු/වරලත් ගොඩනැගිලි සේවා ඉංජිනේරු ආයතනයේ සාමාජික (CIBSE) (එ.රාජධානිය) | 05 |
| වසර 10 ක පළපුරුද්ද සහිත වරලත් ප්‍රමාණ සමීක්ෂක | 05 |
| ගිනි නිවීම් ඉංජිනේරු ආයතනයේ (IFE) (එ.රා) ආයතනික සාමාජික | 05 |
| වරලත් ඉංජිනේරු/වරලත් ගොඩනැගිලි සේවා ඉංජිනේරු ආයතනයේ සාමාජික | 04 |
| වරලත් ජලනල සහ තාපන ඉංජිනේරු ආයතනයේ (CIPHE) සාමාජික | 04 |
| වරලත් ප්‍රමාණ සමීක්ෂක | 04 |
| දෙපාර්තමේන්තු සුදුසුකම් ලත් ඉංජිනේරු | 04 |
| වසර 6 ක පළපුරුද්ද සහිත උපාධිධාරි හෝ සමාන සුදුසුකම් සහිත ඉංජිනේරු | 04 |
| වසර 10 ක පළපුරුද්ද සහිත සංස්ථාගත ඉංජිනේරු | 04 |
| තාපනය, ශීතකරණ සහ වායු සමනය පිළිබඳ ඇමෙරිකානු සංගමයේ (MASHRAE) සාමාජික | 03 |
| ශීතකරණ ආයතනයේ සාමාජික | 03 |
| උපාධිධාරි හෝ සමාන සුදුසුකම් සහිත ඉංජිනේරු | 03 |
| උපාධිධාරි ප්‍රමාණ සමීක්ෂක | 03 |
| සංස්ථාපිත ඉංජිනේරු | 03 |
| ඉංජිනේරු (වෘත්තීමය සුදුසුකම් ලත් ජා.වෘ. සු. මට්ටම 7) | 03 |
| සහකාර ඉංජිනේරු | 02 |
| සහකාර ප්‍රමාණ සමීක්ෂක | 02 |

(ඇ) විශේෂිත ඉදිකිරීම් කොන්ත්‍රාත් කටයුතු සඳහා වෘත්තික සහ අනෙකුත් තාක්ෂණික කාර්ය මණ්ඩලය

| කාණ්ඩය | ලකුණු |
|---|---|
| වසර 15 ක පළපුරුද්ද සහිත වරලත් ඉංජිනේරු | 06 |
| වසර 15 ක පළපුරුද්ද සහිත වරලත් වාස්තු විද්‍යාඥ | 06 |
| වසර 15 ක පළපුරුද්ද සහිත වරලත් ප්‍රමාණ සමීක්ෂක | 06 |
| වසර 10 ක පළපුරුද්ද සහිත වරලත් ඉංජිනේරු | 05 |
| වසර 10 ක පළපුරුද්ද සහිත වරලත් වාස්තු විද්‍යාඥ | 05 |
| වසර 10 ක පළපුරුද්ද සහිත වරලත් ප්‍රමාණ සමීක්ෂක | 05 |
| වරලත් ඉංජිනේරු | 04 |
| වරලත් වාස්තු විද්‍යාඥ | 04 |
| වරලත් ප්‍රමාණ සමීක්ෂක | 04 |
| දෙපාර්තමේන්තු සුදුසුකම් ලත් ඉංජිනේරු | 04 |
| වසර 6 ක පළපුරුද්ද සහිත උපාධිධාරි හෝ සමාන සුදුසුකම් සහිත ඉංජිනේරු | 04 |
| වසර 10 ක පළපුරුද්ද සහිත සංස්ථාපිත ඉංජිනේරු | 04 |
| උපාධිධාරි හෝ සමාන සුදුසුකම් සහිත ඉංජිනේරු | 03 |
| වාස්තු විද්‍යාඥ | 03 |
| උපාධිධාරී ප්‍රමාණ සමීක්ෂක | 03 |
| සංස්ථාපිත ඉංජිනේරු | 03 |
| ඉංජිනේරු (වෘත්තීය සුදුසුකම් ලත්) | 03 |
| සහකාර ඉංජිනේරු | 02 |
| වාස්තු විද්‍යා අධිකාරපත්‍රලාභී | 02 |
| සහකාර ප්‍රමාණ සමීක්ෂක | 02 |

(ඇ) භූ තාක්ෂණික ජම්බාර කොන්ත්‍රාත්කරුවන් සඳහා වෘත්තික සහ අනෙකුත් තාක්ෂණික කාර්ය මණ්ඩලය

| කාණ්ඩය | ලකුණු |
|---|---|
| නිර්මිත ඉංජිනේරුවකු ලෙස වසර 12ක පළපුරුද්ද සහිත වරලත් නිර්මිත ඉංජිනේරු | 05 |
| ජම්බාර ගැසීමේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්ද සහ වසර 12 ක සමස්ත පළපුරුද්ද සහිත වරලත් සිවිල්/යාන්ත්‍රික ඉංජිනේරු | 05 |
| වසර 10 ක පළපුරුද්ද සහිත භූ තාක්ෂණික ඉංජිනේරු ක්ෂේත්‍රයේ විශේෂඥතාව සහිත වරලත් සිවිල් ඉංජිනේරු | 05 |
| නිර්මිත ඉංජිනේරු ලෙස වසර 10 ක පළපුරුද්ද සහිත වරලත් නිර්මිත ඉංජිනේරු | 04 |
| ජම්බාර ගැසීමේ අවම වශයෙන් වසර 02 ක පළපුරුද්ද සහ වසර 10 ක සමස්ත පළපුරුද්ද සහිත වරලත් සිවිල්/යාන්ත්‍රික ඉංජිනේරු | 04 |
| වරලත් භූ තාක්ෂණික ඉංජිනේරු | 04 |
| වසර 10 ක සමස්ත පළපුරුද්ද සහ ජම්භාර ගැසීමේ කාර්යයන්හි අවම වශයෙන් වසර 3ක පළපුරුද්ද සහිත උපාධිධාරී සිවිල්/යාන්ත්‍රික ඉංජිනේරු | 03 |
| වසර 5 ක සමස්ත පළපුරුද්ද සහිත උපාධිධාරී සිවිල්/යාන්ත්‍රික ඉංජිනේරු | 02 |
| වසර 3 ක සමස්ත පළපුරුද්ද සහිත උපාධිධාරී සිවිල්/යාන්ත්‍රික ඉංජිනේරු | 02 |
| වරලත් ප්‍රමාණ සමීක්ෂක | 03 |
| උපාධිධාරී ප්‍රමාණ සමීක්ෂක | 02 |
| සංස්ථාපිත සිවිල්/යාන්ත්‍රික ඉංජිනේරු | 02 |
| දෙපාර්තමේන්තු සුදුසුකම් ලත් සිවිල්/යාන්ත්‍රික ඉංජිනේරු | 02 |
| උපාධිධාරී ඉංජිනේරු | 02 |

(ඉ) අධීක්ෂණ කාර්ය මණ්ඩලය සහ ජා. වෘ. සු. මට්ටම 3 සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලය

| කාණ්ඩය | ලකුණු |
|---|---|
| ඉංජිනේරු සහකාර | 1.75 |
| තාක්ෂණික සහකාර | 1.5 |
| ප්‍රමිණ සමීක්ෂණ සහකාර | 1.5 |
| වැඩමූලික | 1.25 |
| අධීක්ෂක | 1.25 |
| ඉදිකිරීම් ශිල්පී / ජා. වෘ. සු. මට්ටම 3 (N.V.Q.) | 1.0 |

(ඊ) ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීයමය සෞඛ්‍ය කාර්ය මණ්ඩලය

| කාණ්ඩය | ලකුණු |
|---|---|
| ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීයමය සෞඛ්‍ය කළමනාකරු | 4.0 |
| ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීයමය සෞඛ්‍ය නිලධාරී | 3.0 |
| ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීයමය සෞඛ්‍ය අධීක්ෂක | 2.0 |

(උ) පද්ධති කළමනාකරණය

පද්ධති කළමනාකරණය සමාගමේ ස්ථාවරභාවය පිළිබඳ දර්ශකයකි. ඉහළ ශ්‍රේණි සඳහා පද්ධති කළමනාකරණ අවශ්‍යතාවය අනිවාර්ය කොට ඇති අතර (C3 සහ ඉන් ඉහළ ශ්‍රේණි සඳහා, EMI, SPI, GP-P, GP-B1 සඳහා) ඒවා පහත දැක්වෙන පරිදි වේ.

| ප්‍රධාන කොන්ත්‍රාත්කරු | | විශේෂඥ කොන්ත්‍රාත්කරු | | ජම්බාර කොන්ත්‍රාත්කරු | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය | අවශ්‍යතාවය | ශ්‍රේණිය | අවශ්‍යතාවය | ශ්‍රේණිය | අවශ්‍යතාවය |
| CS2 | ISO 9000, ISO 14000 OHSAS 18000 | EMI සහ SPI | ISO 9000 | GP-P සහ GP-B1 | ISO 9000 |
| CS1 | ISO 9000, ISO 14000 OHSAS 18000 | | | | |
| C1, C2 | ISO 9000 | | | | |

ලකුණු වෙන්කිරීම පද්ධති සහතිකකරණයට ලකුණු 30 බැගිනි.

(ඌ) ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීයමය සෞඛ්‍ය

ඉදිකිරීම් කර්මාන්තයේ යහපත් වර්ධනයක් සඳහා ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීයමය සෞඛ්‍යයෙහි නිරතවීම අත්‍යාවශ්‍ය බව හඳුනාගෙන ඇති අතර මේ වන විට ඉහළ ශ්‍රේණි සඳහා පමණක් අනිවාර්ය කර ඇති අතර එය පහත පරිදි වේ.

| ප්‍රධාන කොන්ත්‍රාත්කරු | | විශේෂඥ කොන්ත්‍රාත්කරු | | ජම්බාර කොන්ත්‍රාත්කරු | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය | කාර්ය මණ්ඩලය | ශ්‍රේණිය | කාර්ය මණ්ඩලය | ශ්‍රේණිය | කාර්ය මණ්ඩලය |
| CS2 සහ CS1 | ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීමය සෞඛ්‍ය කළමනාකාරවරයෙක් (01) ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීයමය සෞඛ්‍ය නිලධාරීන් දෙදෙනෙක් (02) ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීයමය සෞඛ්‍ය අධීක්ෂකවරු තිදෙනෙක් (03) | EMI | ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීමය සෞඛ්‍ය නිලධාරීවරයෙක් (01) ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීමය සෞඛ්‍ය අධීක්ෂකවරයෙක් (01) | GP-P සහ GP-B1 | ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීමය සෞඛ්‍ය නිලධාරීවරයෙක් (01) ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීමය සෞඛ්‍ය අධීක්ෂකවරයෙක් (01) |
| C1 | ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීමය සෞඛ්‍ය නිලධාරීවරයෙක් (01) ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීයමය සෞඛ්‍ය අධීක්ෂකවරු දෙදෙනෙක් (02) | SP 1 | ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීමය සෞඛ්‍ය අධීක්ෂකවරයෙක් (01) (අ) ඇළුමිනියම් සහ නිමැයුම්, (ආ) පස් ඇණලෑම සහ ස්ථායිකරණය සහ කාණ්ඩ සඳහා පමණි | | |
| C2 සහ C3 | ඉදිකිරීම් සුරක්ෂිතතාව සහ වෘත්තීමය සෞඛ්‍ය අධීක්ෂකවරයෙක් (01) | | | | |

(එ) අඛණ්ඩ නිපුණතා සංවර්ධනය (CCD) - වසර තුනක කාල සීමාවක් තුළ

අඛණ්ඩ නිපුණතා සංවර්ධනය හඳුන්වා දී ඇත්තේ කොන්ත්‍රාත්කරුවන්ගේ/ඔවුන්ගේ කාර්ය මණ්ඩලයේ කර්මාන්තය පිළිබඳ දැනුම යාවත්කාලීන කරගැනීමට ඔවුන් දිරිමත් කිරීම පිණිස වන අතර පහත දැක්වෙන ශ්‍රේණි සඳහා එය අනිවාර්ය කර තිබේ.

| ප්‍රධාන කොන්ත්‍රාත්කරු | | විශේෂඥ කොන්ත්‍රාත්කරු | | ජම්බාර කොන්ත්‍රාත්කරු | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය | ලකුණු | ශ්‍රේණිය | ලකුණු | ශ්‍රේණිය | ලකුණු |
| CS2, CS1 | 200 | EM1, EM2, SP1 | 70 | GP-B1 GP-P | 70 |
| C1 | 150 | SP2 | 50 | GP-B2 | 50 |
| C2, C3 | 100 | | | | |
| C4 | 70 | | | | |
| C5 | 50 | | | | |

(ඒ) බාහිර අභ්‍යාසලාභීන් සඳහා පුහුණුව සැපයීම

ඉදිකිරීම් කර්මාන්තයට අළුතින් පිවිසෙන්නන් හට සහාය වීමේ අරමුණින් බාහිර අභ්‍යාසලාභීන් සඳහා පුහුණුව සැපයීම අනිවාර්ය කර ඇති අතර එහි වත්මන් අවශ්‍යතාවය පහත දැක්වෙන පරිදි වේ.

| ප්‍රධාන කොන්ත්‍රාත්කරු | | විශේෂඥ කොන්ත්‍රාත්කරු | | ජම්බාර කොන්ත්‍රාත්කරු | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය | පුහුණුවන්නන් ගණන (අවම) | ශ්‍රේණිය | පුහුණුවන්නන් ගණන (අවම) | ශ්‍රේණිය | පුහුණුවන්නන් ගණන (අවම) |
| CS2 | 50 | EM1 සහ SP1 | 05 | GP-B1 සහ GP-P | 05 |
| CS1 | 30 | | | | |
| C1 | 10 | | | | |
| C2 සහ C3 | 05 | | | | |
| C4 | 02 | | | | |

(ඔ) ආයතනික සමාජ වගකීම ලකුණු (ආ.ස.ව)

ආයතනික සමාජ වගකීම සෑම ව්‍යාපාරික ආයතනයකම වගකීමක් වේ. කෙසේ වෙතත්, මූලික පියවරක් ලෙස මාර්ගෝපදේශයෙහි මෙය පහත දක්වෙන ශ්‍රේණි සඳහා හඳුන්වා දී තිබේ.

| ප්‍රධාන කොන්ත්‍රාත්කරු | | විශේෂඥ කොන්ත්‍රාත්කරු | | ජම්බාර කොන්ත්‍රාත්කරු | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය | එක් වසරක් තුළ රු. මිලියන | ශ්‍රේණිය | එක් වසරක් තුළ රු. මිලියන | ශ්‍රේණිය | එක් වසරක් තුළ රු. මිලියන |
| CS2 | 5.0 | EM1 සහ SP1 | 0.5 | GP-B1 සහ GP-P | 0.5 |
| CS1 | 2.0 | | | | |
| C1 | 1.0 | | | | |
| C2 | 0.5 | | | | |
| C3 | 0.25 | | | | |

ලකුණු ලබාදීම මිලියන 0.1 කට එක් ලකුණක් බැගිනි.

## උපලේඛනය 2

### ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම
### ලියාපදිංචි කිරීම් සහ අළුත් කිරීම් සඳහා ගාස්තු උපලේඛනය

(අ) ප්‍රධාන ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෝ

| ශ්‍රේණිය | මූල්‍ය සීමාව (X) රු. මිලියන | වසරක් සඳහා ලියාපදිංචි වීමේ ගාස්තුව/ අළුත් කිරීමේ ගාස්තුව රු. |
|---|---|---|
| CS 2 | X > 3000 | 500,000.00 + VAT |
| CS 1 | 3000 ≥ X>1500 | 300,000.00 + VAT |
| C 1 | 1500 ≥ X>600 | 150,000.00 + VAT |
| C2 | 600 ≥ X>300 | 60,000.00 + VAT |
| C3 | 300 ≥ X>150 | 37,000.00 + VAT |
| C4 | 150 ≥ X>50 | 31,000.00 + VAT |

| ශ්‍රේණිය | මූල්‍ය සීමාව (X) රු. මිලියන | වසරක් සඳහා ලියාපදිංචි වීමේ ගාස්තුව/ අළුත් කිරීමේ ගාස්තුව රු. |
|---|---|---|
| C5 | 50 ≥ X>10 | 26,000.00 + VAT |
| C6 | 25 ≥ X>10 | 20,000.00 + VAT |
| C7 | 10 ≥ X>05 | 15,000.00 + VAT |
| C8 | 05 ≥ X>02 | 8,000.00 + VAT |
| C9 | 02 ≥ X | 6,000.00 + VAT |

(ආ) විශේෂඥ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෝ

| ශ්‍රේණිය | මූල්‍ය සීමාව (X) රු. මිලියන | වසරක් සඳහා ලියාපදිංචි වීමේ ගාස්තුව/ අළුත් කිරීමේ ගාස්තුව රු. |
|---|---|---|
| EM1/ SP1 | X > 50 | 31,000.00 + VAT |
| EM2/ SP1 | 50 ≥ X>25 | 26,000.00 + VAT |
| EM3/ SP3 | 25 ≥ X>10 | 20,000.00 + VAT |
| EM4/ SP4 | 10 ≥ X>02 | 15,000.00 + VAT |
| EM5/ SP5 | 02 ≥ X | 5,650.00 + VAT |

(ඇ) ජම්බාර ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවෝ

| ශ්‍රේණිය | මූල්‍ය සීමාව (X) රු. මිලියන | වසරක් සඳහා ලියාපදිංචි වීමේ ගාස්තුව/ අළුත් කිරීමේ ගාස්තුව රු. |
|---|---|---|
| GP-P | X ≥ 50 | 25,000.00 + VAT |
| GP-B1 | X≥150 | 50,000.00 + VAT |
| GP-B2 | 150 ≥ X>50 | 25,000.00 + VAT |
| GP-B3 | 50 ≥ X>10 | 11,500.00 + VAT |
| GP-B4 | 10 ≥ X | 6,500.00 + VAT |

02-649/2

---

එල්.ඩී.බී. 15/2014

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 58 වන වගන්තිය සමඟ කියවිය යුතු, එම පනතේ 45 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

සජිත් ප්‍රේමදාස,
නිවාස සහ ඉදිකිරීම් අමාත්‍ය.

2018 ජනවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2017 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (තාක්ෂණ විගණන කාර්යපටිපාටිය සහ ගාස්තු) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක තාක්ෂණ විගණනය සඳහා වූ කාර්යපටිපාටිය මෙහි පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකාරයෙන් විය යුතු ය.

3. එම තාක්ෂණ විගණනය සඳහා වූ ගාස්තු මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණවලින් අයකරගනු ලැබිය යුතු ය.

4. මෙම නියෝගවල

"හඳුනාගත් ඉදිකිරීම් වැඩ" යන්නට, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

"තාක්ෂණ විගණනය" යන්නට, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

**පළමුවන උපලේඛනය**

***යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩ තාක්ෂණ විගණනය සඳහා වූ කාර්ය පටිපාටිය***

1. තාක්ෂණ විගණනය සඳහා වන ඉල්ලීමක්, අධිකාරියෙන් ලබාගන්නා තාක්ෂණ විගණනය සඳහා වූ ඉල්ලුම්පත්‍රයකින් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

2. ඉල්ලීමේ සඳහන් කරන ලද කාර්යය තාක්ෂණිකව විගණනය කළ හැකි ද නැද්ද යන්න පිළිබඳව අධිකාරිය විසින් විචාරා දැන ගත යුතුය. ඉල්ලීමට අනුව එය තාක්ෂණිකව විගණනය කළ නොහැකි නම්, ඒ ඉල්ලීම ලැබුණ දින සිට වැඩ කරන දින 14 ක් තුළ ලිඛිතව ඉල්ලුම්කරුට ඒ පිළිබඳව දැනුම් දිය යුතු ය.

3. ඉල්ලීම ලැබුණ දින සිට දින 14 ක් තුළ අධිකාරිය විසින් පවත්වාගෙන යන ගුණාත්මක කළමනාකරණ විගණකවරුන්ගේ රෙජිස්ටරයේ ලැයිස්තුගත කර තිබෙන්නේ යම් තැනැත්තන්ද, ඒ තැනැත්තන් අතරින් තෝරාගත් ගුණාත්මක කළමනාකරණ විගණකවරයකු/ විගණකවරු අධිකාරිය විසින් පත් කරනු ලැබිය යුතු ය.

4. ගුණාත්මක කළමනාකරණ විගණකවරු විසින් විගණනය සහ විගණන විෂය පථය පිළිබඳ ප්‍රකාශන සහ වැය යෝජනා සකස් කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය අධ්‍යයනය කර බැලිය යුතු ය.

5. ලබාගත් විගණන විෂය පථ ප්‍රකාශනය සහ වැය යෝජනා පිළිබඳව අධිකාරිය විසින් පත්කරන ලද ඇගයීම් මණ්ඩලයක් විසින් ඇගයීමක් සිදු කරනු ලැබිය යුතු අතර, අවශ්‍ය සංශෝධනයක් ඇත්නම් එය සිදු කිරීමෙන් පසුව අධිකාරිය විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

6. විගණන විෂය පථය, වැය, තාක්ෂණ විගණනයේ කාල සීමාව, දෙපාර්ශවයේ වගකීම් හා බැඳීම් පිළිබඳ කරුණු ඇතුළත් ගිවිසුමකට අධිකාරිය විසින් ඉල්ලුම්කරු සමඟ එළඹිය යුතු ය.

7. විගණනයෙහි ප්‍රමාණය හා සංකීර්ණභාවය මත විගණන කණ්ඩායම උපරිම වශයෙන් සාමාජිකයින් තුන් දෙනෙකුගෙන් සමන්විත විය හැකි ය.

8. විගණන කණ්ඩායම සාමාජකයින් දෙදෙනෙකු හෝ තුන් දෙනෙකුගෙන් සමන්විත වේ නම් අධිකාරිය විසින්, තෝරාගත් ගුණාත්මක කළමනාකරණ විගණකවරුන් විමසා කණ්ඩායමේ නායකයා තීරණය කළ යුතු ය. අධිකාරියේ තීරණය අවසාන සහ බන්ධනීය ප්‍රමාණ්‍යය වේ.

9. ගුණාත්මක කළමනාකරණ විගණකරුවන්ට කාර්යයන් ඉටුකිරීමට නොහැකි වන හෝ නුසුදුසුකම් සොයාගනු ලබන අවස්ථාවක, ගුණාත්මක කළමනාකරණ විගණකවරුන් ආදේශ කිරීම අධිකාරියේ අභිමතය පරිදි සිදු විය යුතු ය.

10. ගුණාත්මක කළමනාකරණ විගණකවරයකු අධිකාරිය විසින් තීරණය කරන ලද පරිදි විෂමාචාර ක්‍රියාවක් සඳහා වරදකරු වුවහොත් වහා බලපවත්වන පරිදි හෝ සම්බන්ධතා සට්ටනයක් ලෙසින් වූ වෙනත් හේතුවක් නිසා වරදකරු වුවහොත් වැඩ කරන දින 14ක පෙර දැනුම් දීම මගින් ඔහුගේ සේවය අත්හිටුවීමේ අයිතිය අධිකාරිය සතුවිය යුතු ය. මෙවැනි අවස්ථාවක දී, ගුණාත්මක කළමනාකරණ විගණනකරුවා විසින් සිදුකරන ලද කාර්යභාරය අධිකාරිය විසින් පිළිනොගනී.

11. දීර්ඝකාලීන රෝගී තත්වයකට පත්වීම නිසා හෝ යම් පිළිගත හැකි හේතුවක් යටතේ ගුණාත්මක කළමනාකරණ විගණකවරයකු ඉල්ලා අස්වීම සම්බන්ධයෙන් වූ කාරණාවක දී ඒ ගුණාත්මක කළමනාකරණ විගණකවරයා විසින් දැනටමත් කරගෙන යනු ලබන කාර්යයන් වලංගු ලෙස සලකනු ලැබිය යුතු අතර අධිකාරිය විසින් අවස්ථාවෝචිත පරිදි ආදේශකයකු ලෙස වෙනත් යම් තැනැත්තකු පත් කිරීම හෝ පත් නොකිරීම තීරණය කරනු ලැබිය හැකි ය.

12. ගුණාත්මක කළමනාකරණ විගණකවරුන් විසින් නියම කරන ලද සියලු තොරතුරු ඉල්ලුම්කරු සහ වෙනත් ආශ්‍රිත පාර්ශවයන් විසින් ඉදිරිපත් කළ යුතු ය.

13. ගුණාත්මත කළමනාකරණ විගණකවරුන් විසින් තාක්ෂණ විගණන කාර්යයන් සඳහා නියම කර ඇති හඳුනාගත් ඉදිකිරීම් වැඩ බිම් සහ වෙනත් ස්ථාන පරික්ෂා කළ හැකි ය. අධිකාරියෙන් යම් ලිඛිත උපදෙස් ලැබීමෙන් පසුව වැඩ බිම සහ එවැනි යම් ස්ථානයක අයිතිය ඇති පාර්ශවයන් විසින් අධිකාරිය විසින් බලය දෙන ලද යම් තැනැත්තෙකුට එම පරිශ්‍රයෙන්ම ඇතුළු වී තාක්ෂණ විගණය කරගෙන යාමට අවසර දිය යුතු ය.

14. ගුණාත්මක කළමනාකරණ විගණකවරුන් විසින් වාචිකව, දිවුරුම් ප්‍රකාශයකින් වූ ලියවිල්ලකින් හෝ වෙනත් යම් පිළිගත හැකි ක්‍රමයකින් සාක්ෂි ලබා ගැනීමට හඳුනාගත් ඉදිකිරීම් වැඩට සම්බන්ධ වී ඇති යම් පාර්ශවයක් අධිකාරිය මාර්ගයෙන් කැඳවනු ලැබිය හැකි ය.

15. තාක්ෂණ විගණන වාර්තාවක නිකුත් කරන දිනය, හැඳින්වීම, විධායක සම්පිණ්ඩනයක්, තාක්ෂණ විගණන විෂය පථය, සිදුකරන ලද තාක්ෂණ විගණනයේ විස්තරාත්මක තොරතුරු, අදළ කර ගත හැකි විශ්ලේෂණ ක්‍රම, එකඟතාවය සහ/හෝ අනුකූලතාවය පරික්ෂා කිරීම සඳහා යොදු ගන්නා සම්මතයන්. නිර්දේශ සහ නිගමන අනිවාර්යයෙන්ම ඇතුළත් කළ යුතු ය. වාර්තාව තහවුරු කිරීමට සහ තහවුරු කිරීමේ දී සඳහන් කරන ලද අදළ සියලු ලේඛන සහ ලිපිවල පිටපත් ද ඇතුළත් කළ යුතු ය.

**දෙවන උපලේඛනය**

***තාක්ෂණ විගණන ගාස්තු අයකිරීමේ අනුප්‍රමාණ***

| *අයිතම පිළිබඳ විස්තර* | *මුදල (රු)* |
|---|---|
| 1. තාක්ෂණ විගණන සඳහා ඉල්ලුම් පත්‍ර ගාස්තුව | රු. 5,000.00 |
| 2. තාක්ෂණ විගණනය කරගෙන යාම සඳහා අත්තිකාරම් ගෙවීම් | ඇස්තමේන්තු කරන ලද පිරිවැයෙන් 50% |
| 3. වාර්තාව නිකුත් කිරීමට පෙරාතුව කළ යුතු ගෙවීම් | ඇස්තමේන්තු කරන ලද පිරිවැයෙන් ඉතිරි 50% |

02-649/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.